# පරිසර හානි විපාක

1 පිටුවෙන්......





වැසෙන සේ කර ඇති ඉදිකිරීම් නිසාය.

දැනට දශක දෙක තුනකට පෙරද කොළඹ, පින්තුපිටිය, ඔරුගොඩවත්ත සහ විටෙක රීඩ් මාවත වැනි ප්‍රදේශවල පවා ගැලීම් සිදුවුවද ඇල කණ්ඩි ආදිය නිසාත්, අවශ්‍ය තැන්වලදී ජලය පොම්ප කොට විශාල ජලමාර්ග වලට හරවා යැවීම් ආදියෙන් පිළියම් කළ හැකිවිය.

නමුත් අද තත්වය එසේ සරල නැත. දැන් අහල් කීපයක වැස්කින් පවා කොළඹ සහ ඒ අවට බොහෝ පෙදෙස් යට වෙන්නේ ජලය ගලා යෑමට තිබුනු මාර්ග බොහොමයක් ඇහිරී ඇති බැවිනි. මේවා දශක දෙක තුනක් තිස්සේ පිළිවෙලක් සැලැස්මක් නැතිව හෝ නොතකා කළ ඉදිකිරීම් වල ප්‍රතිඵල ය.

**ගිය මාසයේ ශ්‍රීලංකාවේ ඇතිවූ ගංවතුරෙන් සිදු වූ හානිය ඉමහත්ය. ප්‍රදේශ රාශියක් සහ මහා මාර්ග ගංවතුරෙන් යටවී ජන ජීවිත අක්‍රිය වී දින ගණනාවක් අපේ රට තිබූ සැටි මෙසේ ය.**

## පිළිවෙලක් නොමැති සංවර්ධනය

කොළඹ පමණක් නොව ඒ වටා ඇති ජනාකීර්ණ දිස්ත්‍රික්ක වල ඇති බොහෝ නගර නවීන පන්නයේ ව්‍යාපාරික ගොඩනැගිලි ජනාවාස ආදිය සිදුවෙමින් සීඝ්‍ර සංවර්ධනයකට භාජනය වෙමින් පවතී. මේවා බොහොමයක් නිසි පිළිවෙලකට පරිසර සාධක ගැන සැලකිලිමත් වෙමින් කෙරෙන ඒවා නොවන බව විමසිල්ලෙන් බලන්නෙකුට පෙනී යයි. නාගරික සැළසුම් කිරීම් ඒවා ක්‍රියාවට නැගීම් ආදිය ගැන ලියවිලි වාර්තා එමට ඇත. පරිසරවේදීන් හා ඉන්ජිනේරු විශේෂඥයින් එමට ඇත. නමුත් වැඩ කටයුතු ක්‍රියාත්මක වන්නේ මේ අදහස් අනුව නම් නොවේ.

## සැළසුම්කරණය

ජනාවාස නගර හා ග්‍රාමීය සැලසුම් කරණයේදීද භූමි ප්‍රමාණය විදිමත් ලෙස යොදා ගනිමින් කටයුතු යෙදේ. ගොවිතැන්, කෘෂිකාර්මික කටයුතු සඳහා කාර්මික නිෂ්පාදනය, ජනාවාස, වෙළඳ ව්‍යාපාර සේවාවන් ආදී මෙවන් මිනිස් ක්‍රියාවලි සඳහා භූමි ප්‍රමාණය විධිමත්ව යොදා ගනිමින් සැලසුම් කරණය සිදුකෙරේ. අප රටේ ද පොතේ හැටියට නම් මේවා එමට ඇත. නමුත් ක්‍රියාවට නැගෙන විට ඒ කිසිවක් සැලකිල්ලට පැත්ත පලාතකට නොගනී.

පාරවල් සෑදුවද නිසි පරිදි තාර දමා නැත. කානු කපා නැත. කානුවක් මුලදී තිබුණ ද එයට පසුව සෑදෙන ගොඩ නැගිලි බොහෝ විට තාප්ප නිසා වැසී යයි. කොළඹ නගරයේ මධ්‍යම ප්‍රමාණ යේ භෝජනාගාරයක (හෝටලයක) පිටුපසට ගිය විට පවතින තත්වයෙන් සියල්ල අවබෝධ වෙයි. නාගරික සෞඛ්‍ය නිලධාරීන් දකින්නට වත් නැත. කටයුතු කෙරෙන්නේ පාරිභෝගිකයාගේ ආරක්‍ෂාව සඳහා නොව මුදලාලිගේ වාසිය පිණිසය නමුත් මේ තැන් යහතින් **බිස්නස්** කරති. ඉතින් සැලසුම් ක්‍රියාත්මක වන්නේ කෙසේද?

## නිලධාරි දූෂණය දේශපාලන දූෂණය

එක පැත්තකින් මේ අක්‍රමිකතා නිලධාරි දූෂණය නිසා ය. උදාහරණයක් වශයෙන් කෙනෙක් ගොඩනැගිල්ලක ඉදිකිරීමක් සඳහා පළාත් හෝ නගරසභා සැළසුම් අවසරයක් සඳහා ඉල්ලුම් පතක් ඉදිරිපත් කළේ යයි සිතමු. ටික කලක් ගතවූ පසු එය එම අංශයෙන් බොහෝවිට ප්‍රතික්‍ෂෙප වෙයි. ඉල්ලුම්කරු පසුබැස මේ ගැන කළයුතු දැ කුමක්දැයි විමසුම් කරයි. ඒ අංශයේ කායීසාධන අසවල් නිලධාරියාට පුද්ගලිකව කතාකර බලන්න යයි වක්‍ර මාර්ගයකින් උපදෙසක් ලැබේ. ඒ උපදෙස ඒ අංශයට සම්බන්ධ තරච්කාරයෙකුගේ මාර්ගයෙනි. එහි සැඟවුණු අර්ථය ඉල්ලුම්කරු තේරුම් ගෙන සුදුසු පරිදි අදාල බලධාරියා හමුවූ විට අර මොන අඩුපාඩුව තිබුණද ඉල්ලුම් පත්‍රය අනුමත වෙයි. මුලින් කී නීති රීති මොනවා උල්ලංඝනය වුව ද ප්ලෑනය පාස්වෙයි.

මේ එක පැත්තකි. අනෙක් යා හැකි මග නම් යම් දේශපාලනඥයෙක් අල්ලා ගෙන කටයුතු කිරීමයි. මොන අඩුපාඩු තිබුණත්, මොන නීති රීති මොනවා උල්ලංඝනය වුනත් ඒ මගින්ද කටයුත්ත කරගත හැකි වෙයි.

මේ දෙපැත්තම දූෂිත අක්‍රමික මාර්ග වෙති. නමුත් අප රටේ සාමාන්‍ය පිළිවෙල මෙය බව කවුරුත් දන්නා විවෘත රහසකි. සෑම නිලධාරියෙක්ම සෑම දේශපාලනඥයෙක් ම එසේ යයි අපි නොකියමු. එහෙත් අවංක අය විරලය. ඉතින් කටයුතු හරියට සිදුවන්නේ කෙසේද?

## පරිසරය පිළිබඳ ඇමති කමිටුවේ වගකීම

පරිසරය පිළිබඳව දූරදර්ශිව සහ අනුදැක් මක් ඇතිව කටයුතුකිරීම ඇරඹුණේ මේ මෑතක ය. පරිසරයේ වැදගත්කම ගැන දියුණු ලෝකයේ ඇස් ඇරුණේ ද දශක දෙකක තුනක කාලයක සිට ය. මෙයට විශේෂ හේතු වූයේ ගෝලීය උණුසුම් කරණයයි. අප රට පුරාණයේ සිට පරිසරයේ වටිනාකම පිළිබඳව සැලකිල්ලට ගැනිණ. නමුත් මෑතක සිට ගෝලීය මට්ටමේ වාණිජ කරණයත් එහි ප්‍රතිඵලත් නිසා අද ගම්බදව පවා පරිසරය ගැන තැකීම අමතක වී තිබේ. පරිසර හානියේ ක්‍ෂණික ආදීනව සහ දීර්ඝකාලීන ආදීනව ගැන මේ ලිපියේ අපි පෙන්වූයෙමු. කෙටි කාලීන වැඩ පිළිවෙලවල් තුළින් ක්‍ෂණික පිළියම් කළ හැකිය. මේවා පරිසර අංශයට වඩා ආපදා කළමනාකරණ අංශය තුළින් කෙරිය යුතු දේවල් ය.

අප රටේ බොහෝ පරිසර ප්‍රශ්න නොදැනුවත්කම නිසා හෝ ආත්ම ලාභය නිසා පරිසරය ගැන නොතැකීම නිසා හෝ මතුවී ඇති ඒවා වෙති. පරිසර අමාත්‍යංශයක් පවා ඇතිවූයේ මෑතකය. නමුත් එම අමාත්‍යංශය අද ප්‍රබලව ඉදිරි යට යනු දැක්ම සතුටකි. එසේම නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතන වලටද පරිසරය ගැන අද ඇත්තේ විශාල වගකීමකි. මේ කරුණු ගැන දුරදක්නා පරිදි සොයා බලා පිළියම් යෝජනා කිරීම පමණක් නොව අදාල අමාත්‍යංශ මගින් ඒවා ක්‍රියාවට නැගීමට සැකසීමට ද මෙම ප්‍රබල ඇමති කමිටුවට හැකිවේවායි ප්‍රාර්ථනා කරමු. - **සංජය**





**ලංකාව බංගලාදේශ් තත්වයට පත්වන්නට ඉතා ආසන්නය**

# US OIL SPILL WIPES OUT WILDLIFE
# මුහුදේ තෙල් ඉහිරීම සතුන්ට විනාශය ගෙනේ



A PITIFUL pelican lies mired in oil - doomed to die unless hard-pressed rescuers can reach it in time. Its plight is a drop in the ocean of devastation caused by the massive BP (British Petroleum Co) spill which is America's worst-ever environmental disaster.

It is almost seven weeks since the Deepwater Horizon rig blast 100 miles away sent an estimated 35 million gallons of crude oil spewing into the Gulf of Mexico.

BP admits the leak will continue until August. And it will get worse. A lot of ordinary American citizens are angry and say BP is not doing enough to stop the oil spreading.

Also badly affected is America's seafood business. Communities that live almost entirely off the waters, is losing thousands of pounds a week. The shrimps, oysters and other fish that provide their livelihoods are assumed dead

Not only the wild life, but also the people who worked for BP disaster clean up have ended up in hospital suffering sickness and respiratory problems, feared to have been caused by chemicals used to disperse the oil.

BP chief executive Tony Hayward is now a figure of loathing. The British firm's boss has claimed the spill is "relatively tiny" - and said the illness was food poisoning.

One US newspaper has branded him "the most hated - and clueless - man in America".
The US Government has now launched a criminal probe.

**(Courtesy - Sun - UK)**

**ගි**ය මස ඇමරිකානු මුහුදේ, මැක්සිකානු බොක්කේ, මුහුදු පත්ලේ බීපී හෙවත් බ්‍රිටිෂ් පැට්‍රෝලියම් සමාගම මෙහෙයවන තෙල් ආකාරයක වූ පිපිරීමකින් බොර තෙල් ගැලුම් මිලියන 35 ක් පිටතට ගලා මුහුදු ජලයට මිශ්‍රවීම නිසා වචනයෙන් කිව නොහැකි විනාශයක් පරිසරයට ද මුහුදු ආශ්‍රිත ජීවීන්ට ද සිදුව ඇත. එය මෑත කාලයේ සිදුවූ විශාලතම පරිසර විනාශයයි.

ලක්‍ෂ ගණනින් මත්ස්‍යයින්ද මුහුදු කුරුල්ලන්ද මිය යන අතර මෙයින් ඇමරිකාවේ ප්‍රදේශ කීපයකම ධීවර කර්මාන්තයට මරු පහරක් වැදී ඇත. එසේම විනාශය සුද්ධකරන්නට මුහුදට ගිය බොහෝ අයද විවිධ රෝග වලට භාජනය වී රෝහල් ගතව ඇත. දැන් ඇමරිකානුවන්ට **BP** සමග ඇත්තේ දැඩි තර හකි. එයට එක් හේතුවක් නම් එම විනාශයට වගකීම බාර ගන්නට **BP** අකමැතිවීමයි. එම සමාගමට නඩුපවරන්නට යන බවක් ද අසන්නට ලැබේ.





**A sea-bird and a pelican are among thousands of species soaked in crude oil that leaked into Mexican Gulf last month.**
***ඉහිරුණු බොරතෙල් වලින් පෙඟුණු කුරුල්ලන් දෙදෙනෙක් අසරණව ඇමරිකානු මුහුදු වෙරළේ සිටින හැටි.***